කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී අධ්‍යයන ධාරා දෙවන වසර පරීක්ෂණය
දෙවන සෙමෙස්තරය - 2019/2020

# SLG 2219 – නිර්මාණාත්මක ලේඛනය

(පැ දෙකයි)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

---

01. "ස්වකීය නිර්මාණ අනුභූතියට උචිත පරිදි භාෂාව හසුරුවා ගැනීම නිර්මාණකරුවාගේ ශක්‍යතාවකි" '<u>විලාසිනියකගේ ප්‍රේමය</u>' නවකතාව පදනම් කර ගනිමින් ඉහත අදහස විමසන්න.

02. "සාහිත්‍යකරුවෙකුගේ පෞද්ගලික අත්දැකීම් ප්‍රතිනිර්මාණය කිරීමෙන් පමණක් උසස් සාහිත්‍ය නිර්මාණ බිහි නොවේ." පක්ෂව හෝ විපක්ෂව අදහස් දක්වමින් උක්ත ප්‍රකාශය විවරණය කරන්න.

03. 'එක් එක් සාහිත්‍යාංගයේ අනන්‍ය ලක්ෂණවලට සාපේක්ෂව චරිත නිරූපණය සඳහා අනුගමනය කෙරෙන විධික්‍රම වෙනස් වේ.' සාකච්ඡා කරන්න.

04. "විශිෂ්ට නිර්මාණයක ආකෘතිය යනු එකී නිර්මාණ අන්තර්ගතයෙහි ප්‍රකාශන විලාසයයි." <u>නූතන සිංහල පද්‍ය නිර්මාණ</u> ඇසුරින් විමර්ශනය කරන්න.

05. පහත සඳහන් මාතෘකාවලින් <u>දෙකක්</u> (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I. අනුකරණය
II. ව්‍යංග්‍යාර්ථ
III. කලාත්මක පරිසමාප්තිය හා ජීවන දෘෂ්ටිය
IV. නිර්මාණාත්මක පරිකල්පනය

********************